# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 54 දරන සුව සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 54 දරන සුව සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

]සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

**එල්. ඩී.—ඕ. 42/91**

**සුව සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

“සුව සහන සේවා පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟවූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබූවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද එම සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින්ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 54 දරන සුව සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සුව සහන සේවා පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කෙරෙන) සුව සහන සේවා පදනමේ සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කෙරෙන) “සුව සහන සේවා පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමටද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

(අ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත් ද්‍රව්‍ය භාවිතයෙන් පාසැල් දරුවන් වළක්වාලීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ඒ කටයුතුවල නිරතවීම ;

(ආ) බුලත් සැපීම පුරුද්දක් වශයෙන් කරගෙන යන තැනැත්තන්ගේ ඒ පුරුද්ද අතහැරවීමට කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ බුලත් සැපීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල පිළිබඳව දැනුමක් ඇති කිරීමට අවශ්‍ය පියවරවල් ගැනීම ;

(ඇ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් ඇතිවිය හැකි සෑම වර්ගයකම රෝග හා අසනීප වැළැක්වීම හා සුව කිරීම සඳහා මූල්‍ය ආධාර දීම ;

(ඈ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් අනිෂ්ට විපාක ලබා සිටින පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමේ කාර්යයන්හි නිරත වී සිටින ආයතනයන්ට සහායවීම සහ මූල්‍ය ආධාර දීම ;

(ඉ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ ඵලවිපාක පිළිබඳ සම්මන්ත්‍රණ, සාකච්ඡා රැස්වීම්, පෙරහැරවල්, ප්‍රචාරක දැන්වීම් ව්‍යාපාර සහ රචනා, තරග, සංවිධානය කිරීම ;

(ඊ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ අහිතකර ප්‍රතිඵල පිළිබඳ පර්යේෂණ කරන ආයතනයන්ට, පරීක්ෂණාගාරවලට සහ අධ්‍යාපන කණ්ඩායම්වලට ආධාර මුදල් පිරිනැමීම, දීම, ශිෂ්‍යත්ව ආධාර සහ ශිෂ්‍යත්ව දීම, ත්‍යාග, පරිත්‍යාග සහ ආධාර දීම සහ සහායවීම ;

(උ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ අහිතකර ප්‍රතිඵල පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා පර්යේෂණ ආයතන පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඌ) දුම්කොළ, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ ප්‍රතිඵල පිළිබඳ අවබෝධයක් මහජනයාට ලබාදීම ; සහ

(එ) දුම්පානයෙන් සහ දුම්කොළ නිෂ්පාදන පාවිච්චි කිරීමෙන් වාතය අපිරිසිදුවීම වැළැක්වීම ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට** යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ උපයා ගැනීම, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පදිංචි තැනැත්තන්ගෙන් ප්‍රදාන සහ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතුකිරීම ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම සේවයේ නියුක්ත කිරීම හෝ සේවයෙන් නෙරපීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන කමිටු පත්කිරීම සඳහා බලය ද ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලට සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතුවල සාමාන්‍ය පරිපාලනය හා කළමනාකරණය, එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන නිලධරයන්ගෙන් සහ වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) තම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් මිස, පදනමේ මූලාරම්භකයා වූ උපාලි සමරරත්න මහතා තම ජීවිත කාලය තුළ පදනමේ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී එම රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයට නොඅඩු ඡන්දයකින් සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන්ගේ විශ්‍රාම ගැනීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම, නිලධරයන් තෝරා පත්කර ගැනීම සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී පදනමේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

දේපළ අත්කර ගැනීමට සහ මුදල් ලබා ගැනීමට ඇති බලය.

7. (1) මිලට ගැනීමෙන්, ත්‍යාග වශයෙන්, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීමෙන්, රික්ථවරණය කිරීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීමේ සහ දැරීමේ ද එසේ අත්කර ගන්නා ලද හෝ දරන හෝ දේපළ නියාදනය කිරීමේ ද බලය නීතියෙන් සංස්ථාවට ඇත්තේ ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ශ්‍රී ලංකාවෙන් හෝ විදේශයකින් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට සංස්ථාවට බලය ඇති අතර, එම මුදල් ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා යම් උකස්කර, බැඳුම්කර හෝ ණයකර ඇති කිරීමේ, ලියා අත්සන් කිරීමේ, ප්‍රදානය කිරීමේ සහ නිකුත් කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

(3) සංස්ථාව විසින් අත් කර ගන්නා ලද හෝ දරනු ලබන සියලු චංචල හා නිශ්චල දේපළ සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියලු මුදල් සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සංස්ථාව විසින් දැරිය යුතු, පරිහරණය කළ යුතු සහ යෙදිය යුතු අතර, සංස්ථාවේ රීතිවලට යටත්ව එවැනි යම් දේපළක්

සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන පරිදි මිලට ගැනීමේ, විකිණීමේ, ප්‍රදානය කිරීමේ, පවරා දීමේ, පැවරීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ හෝ උකස් කිරීමේ බලය සහ සංස්ථාවේ අරමුදල් යම්කිසි ආකාරයට ආයෝජනය කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

මණ්ඩලයේ ගිණුම්.

8. (1) සංස්ථාවේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) ලිත් වර්ෂය සංස්ථාවේ මුදල් වර්ෂය විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනම වෙත ගෙවනු ලැබිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සම්මාදම් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේ.

11. සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු, සියලු ණය හා බැඳීම් ගෙවා නිදහස් කිරීමෙන් පසු යම් දේපළක් ඉතුරු වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද කිසිදු ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා ගැනීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් පුණ්‍ය ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දිය යුතු ය, නැතහොත් පැවරිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේදැයි සංස්ථාව විසුරුවා හැරීමේදී හෝ විසුරුවා හැරීමට පෙර, සංස්ථාවේ සාමාජිකයන් විසින් නිර්ණය කරනු ලැබිය යුතු ය.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255 බෞද්ධාලෝක මාවත කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.